2020.9.24 දිනමිණ

සං 1,6

# මීළඟ ජන සංගණනය 2021දී

බුද්ධිකා ඉඹුලාන,
සිතාරා සේනානි

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් මීළඟ සංගණනය 2021 වර්ෂයේදී පැවැත්වීමට සැලසුම් කර ඇත. ශ්‍රී ලංකාවේ ජන හා නිවාස සංගණනය වසර 10කට වරක් පවත්වනු ලබන අතර, සංගණන ආඥා පනතින් ලැබී ඇති බලතල ප්‍රකාරව මෙම සංගණනය පවත්වයි.

පිට 06

## මීළඟ ජන සංගණනය ...

මෙම සංගණනයේ කටයුතු පැවැත්වීම සඳහා මුදල් අමාත්‍ය වශයෙන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර තිබේ.

එම සංගණනය මගින් ජාතික ප්‍රතිපත්ති සම්පාදනයට හා සැලසුම් සකස් කිරීමට අවශ්‍ය වන ජන සංඛ්‍යාව, එහි භූගෝලීය ව්‍යාප්තිය, ජන වාර්ගික ව්‍යාප්තිය සහ ජනගහනයේ ප්‍රජා විද්‍යාත්මක හා සමාජයීය ලක්ෂණ මෙන්ම නිවාස පිළිබඳ ගුණාත්මක හා කාලීන දත්ත සහ තොරතුරු ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටමින් ලබා දෙනු ලබයි.